# **දැන්වීමයි**

**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී පාලි මණ්ඩපය.**

වෑවල - හොරණ

## **විශ්වවිද්‍යාල ප්‍රවේශය - කලා / එස්පී පාඨමාලාව - 2019/2020 අධ්‍යයන වර්ෂය**

### **ප්‍රසංග කලා / ජනමාධ්‍ය පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධි පාඨමාලාව (සිංහල මාධ්‍යය) ඇතුළත්වීම සඳහා පෙනී සිටිය යුතු යෝග්‍යතා පරීක්ෂණය - 2020**

2019/2020 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් සපුරා ඇති සහ මෙම මණ්ඩපයේ ප්‍රවේශය සඳහා සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් 2020 යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

**මෙම පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබා ගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අයදුම්පත් ඉදිරිපත් කිරීමට අමතරව මෙම යෝග්‍යතා පරීක්ෂණයටද අයදුම් කර පෙනී සිට ඉන් සමත් විය යුතුය.**

01. මෙම පාඨමාලාව පැවැත්වෙන්නේ **සිංහල මාධ්‍යයෙන් පමණක්** වන අතර පාඨමාලාවන් දෙක සඳහා අයදුම් කරන සිසුන් වෙනුවෙන් ප්‍රායෝගික / වාචික හා සම්මුඛ පරීක්ෂණයක් හෝ අභියෝග්‍යතා පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

**02. යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය:**

1. මෙහි සඳහන් ආදර්ශ අයදුම්පතේ ආකෘතියට අනුව පිළියෙළ කර ගත් අයදුම් පත්‍රය පමණක් භාවිත කළ යුතුය.

2. **ජනමාධ්‍ය සහ ප්‍රසංග කලා උපාධි පාඨමාලාවන් සඳහා වෙනවෙනම අයදුම්පත් ඉදිරිපත් කළයුතු අතර, ප්‍රසංගකලා උපාධි පාඨමාලාව යටතේ ඇති විෂය ක්ෂේත්‍රයන් වන නර්තනය, සංගීතය, නාට්‍ය හා රංගකලාව, චිත්‍ර හා සැලසුම්කරණය සහ සිනමා අධ්‍යයනය සඳහාද වෙනවෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.**

3. තවද සම්පූර්ණ කරන ලද ඔබගේ අයදුම්පත සමඟ **ඔබගේ නම හා ලිපිනය සහිත සෙ.මී. 10½ × 22½ ප්‍රමාණයේ රු: 45/- ක මුද්දර ගැසූ ලිපි කවරයක් ද අමුණා එවිය යුතුය.**

4. යෝග්‍යතා පරීක්ෂණ ගාස්තු වශයෙන් **රු: 1500/- ක** මුදලක් ගෙවිය යුතුය. මෙම මුදල ලංකා බැංකුව හොරණ ශාඛාවේ ඇති අංක **719939** දරන රැස් කිරීමේ ගිණුමට බැර කිරීමට දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් සාමාන්‍ය පරිදි ගෙවීම් කළ හැකිය.

5. ගෙවීම් වවුචරයේ **මුල් පිටපත අයදුම්පත සමග අමුණා එවිය යුතුය.**

6. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් *2020.04.01 දින හෝ එදිනට පෙර **සහකාර ලේඛකාධිකාරී/ශිෂ්‍ය කටයුතු, ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය, වෑවල, හොරණ** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම් පස උඩ කෙලවරේ "යෝග්‍යතා පරීක්ෂණය - 2020" ලෙස සඳහන් කළ යුතුය.

7. මෙම යෝග්‍යතා පරීක්ෂණය හැකි ඉක්මණින් පැවැත්වීමට කටයුතු කරනු ලබන අතර, සුදුසුකම් ලබන අයදුම්කරුවන්ට යෝග්‍යතා පරීක්ෂණය පැවැත්වෙන දිනය, වේලාව හා ස්ථානය පෞද්ගලිකව දැන්වීමට කටයුතු කරනු ලැබේ.

**සැ:යු:** විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් නොමැතිව අයදුම් කරන අයදුම්කරුවන්ට ප්‍රවේශය නොලැබීම සම්බන්ධයෙන් මණ්ඩපය වගකියනු නොලබනු අතර, **අසම්පූර්ණ හා නියමිත දිනට පෙර එවා නොමැති අයදුම්පත් නැවත විමසීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එවැනි අවස්ථාවකදී අයදුම්කරුවන් විසින් ගෙවා ඇති පරීක්ෂණ ගාස්තු මොන යම් හේතුවක් නිසා හෝ ආපසු ගෙවනු නොලැබේ.**

**නිල වෙබ් අඩවිය : spc.cmb.ac.lk**

***අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2020.06.15 දක්වා දීර්ඝ කර ඇත.**


සහකාර ලේඛකාධිකාරී,
කොළඹ විශ්වවිද්‍යාලය,
ශ්‍රී පාලි මණ්ඩපය,
වෑවල, හොරණ.


2020.03.11 දින.


දුරකථන අංක : 034 – 2263617 / 034 - 2265553

**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී පාලි මණ්ඩපය**

## විශ්වවිද්‍යාල ප්‍රවේශය - 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා කලා/එස්පී පාඨමාලාවට තෝරා ගැනීම සඳහා වූ අයදුම් පත්‍රය

01. සම්පූර්ණ නම : ……………………………………………………………………..
02. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්) …………………………………………………...
03. ජාතික හැඳුනුම්පත් අංකය : ……………………………………………………….
04. ස්ථිර ලිපිනය : ………………………………………………………………..
……………………………………………………………..
දුරකථන අංකය :…………………………………………………………………

05. 2019 වර්ෂයේ අ.පො.ස.(උ.පෙළ) විභාගයට පෙනී සිටි පරිපාලන දිස්ත්‍රික්කය :……………
06. අ.පො.ස.(උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල 2019 (සහතිකයේ පිටපතක් අමුණන්න)

විභාග අංකය :

Z Score :

| විෂයයන් | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |

07. අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂය සඳහා ලබා ඇති ප්‍රතිඵල (සහතිකයේ පිටපතක් අමුණන්න)
(සුදුසුකම් ලැබීම සඳහා අවම වශයෙන් "S" සාමාර්ථයක් ලබා තිබිය යුතුය)
ශ්‍රේණිය : වර්ෂය :

08. තමා හැදෑරීමට අපේක්ෂා කරන පාඨමාලාව :
(අපේක්ෂිත පාඨමාලාව ඉදිරියෙන් √ ලකුණ යොදන්න.)
**(එක් එක් පාඨමාලාව සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය)**

| | | | |
|---|---|---|---|
| ජනමාධ්‍ය | | ප්‍රසංග කලා | |

09. i. ජනමාධ්‍ය පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන්නේ නම් ඊට අදාලව ඔබගේ විශේෂ කුසලතා තිබේ නම් ඒවාට අදාල සහතික පත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළයුතුය.)

ii **ප්‍රසංග කලා පාඨමාලාව හදාරන්නේ නම් අපේක්ෂිත ක්ෂේත්‍රය ඉදිරියෙන් √ ලකුණ යොදන්න.**
**(එක් එක් විෂය ක්ෂේත්‍රය සඳහා වෙනවෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය)**

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | නර්තනය | | 4. | චිත්‍ර හා සැලසුම්කරණය | |
| 2. | සංගීතය | | 5. | සිනමා අධ්‍යයනය | |
| 3. | නාට්‍ය හා රංග කලාව | | | | |

10. රු : 1500/- විභාග ගාස්තු ගෙවූ ලංකා බැංකු ශාඛාව හා දිනය :……………………
(එම ගෙවීම් වවුචරයේ මුල් පිටපත මෙයට අමුණා එවිය යුතුය). …………………..

**මුදල් ගෙවූ කුවිතාන්සිය මෙහි අලවන්න.**

ම'විසින් ඉහත ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බවත්, විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතට අනුව සුදුසුකම් ලබා ඇති බවත් සහතික කරමි. වැරදි තොරතුරු සපයා යෝග්‍යතා පරීක්ෂණය සමත් වුවහොත් මාගේ අපේක්ෂකත්වය අවලංගු වන බවද මම පිළිගනිමි

දිනය : ……………………… …………………………
අයදුම්කරුගේ අත්සන.

---

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි. නිර්දේශය :

පරීක්ෂා කලේ :

**(A-4 ප්‍රමාණයේ කඩදාසියක තනි පිටුවක පමණක් සකස් කරගත යුතුය)**